දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක-:15/12

මගේ අංකය-: බ13/01

බන්ධනාගාර මූලස්ථානය,

කොළඹ 09.

2012.06.22

සියළුම බන්ධනාගාර අධිකාරීන්/ සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත,

**<u>බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුමේ ගිණුම් පිලිවෙත.</u>**

මෙතෙක් ක්‍රියාත්මක වූ ඉහත ගිණුමේ ගිණුම් පිලිවෙත 1987.01.01 දින සිට පහත දැක්වෙන වෙනස් කිරීම්ද, ඇතුළුව තවදුරටත් ක්‍රියාත්මක කල යුතුය.

02. (1) <u>රජයේ බිල්පත් (බන්ධනාගාර දෙපාර්තමේන්තුව)</u>

රජයේ බිල්පත් නිකුත් කිරීම සඳහා එක් වර්ෂයකට අදල බිල්පත් අංක මූලස්ථානය විසින් බන්ධනාගාර අධිකාරීවරුන් වෙත වෙන්කර දෙනු ඇත. බිල්පත් නිකුත් කලයුත්තේ අදල අංක යටතේ අනුපිලිවෙලටය. එසේ නිකුත් කරනු ලබන සෑම බිල්පතකම වැය ශීර්ෂය සඳහන් කිරීම අනිවාර්ය වේ. එක් වැය ශීර්ෂයකට වඩා වැඩි වන්නේ නම් එක් එක් වැය ශීර්ෂය වෙන් වෙන්ව සඳහන් කල යුතුය. මේ අනුව බන්ධනාගාර අධිකාරීවරයෙකු/ සහකාර අධිකාරීවරයෙකු විසින් නිකුත් කරනු ලබන බිල්පතක මුල් පිටපත එම බිල්පත් නිරවුල් කලයුතුව ඇති බන්ධනාගාර ආයතනයට කෙලින්ම යැවිය යුතුය. එසේ යැවෙන බිල්පත් වල-:

1. ආවරණ ලිපියේ පිටපතක්ද,
2. බිල්පත් වර්ගීකරණයද,
3. බිල්පත් වල දෙවැනි පිටපතද,

ඊලග මාසයේ 10 වැනි දිනට ප්‍රථම මූලස්ථානය වෙත එවිය යුතුය. එම බිල්පත් ලැබෙන බන්ධනාගාර ආයතනය විසින් එම මස අවසාන වීමට ප්‍රථම බිල්පත් නිරවුල් කර බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (කර්මාන්ත) නමට ලියන ලද චෙක්පතක් මූලස්ථානය වෙත එවිය යුතුය. එම චෙක්පත සමග එවන ආවරණ ලිපියෙහි පහත දැක්වෙන තොරතුරු ඇතුලත් විය යුතුය.

| අනු අංකය | බිල්පත් අංකය | මුදල රු. |
|---|---|---|
| 1. | .............................. | .............................. |
| 2. | .............................. | .............................. |
| 3. | .............................. | .............................. |
| | එකතුව | ______________________ |

ඉහත දැක්වෙන ආවරණ ලිපියේ පිටපතක් බිල්පත් එවනු ලැබූ බන්ධනාගාර ආයතනය වෙත අනිවාර්යෙන්ම තැපැල් කල යුතුය.

02 (11). බන්ධනාගාර අධිකාරීවරයෙකු විසින් වෙනත් බන්ධනාගාර ආයතන වලට බිල්පත් නිකුත් කල විට ඒ පිළිබඳව වාර්තාවක් තබාගත යුතු අතර, බිල්පත් ලැබූ බන්ධනාගාර ආයතන විසින් බිල්පත් නිරවුල් කිරීමේදී මූලස්ථානය වෙත චෙක්පත් සමග එවන ආවරණ ලිපියේ පිටපතක් ඉහත සඳහන්වූ වාර්තා සමග සැසදිය යුතුය. බිල්පත් නිකුත් කිරීමෙන් පසු මසක් ඇතුලතදී අදල බන්ධනාගාර ආයතනය විසින් එම බිල්පත් නිරවුල් නොකරන

ලද බව හෙළිවන්නේ නම් ඒ පිළිබඳව අදාල ආයතනයෙන් විමසිය යුතු අතර, එම ලිපියේ පිටපතක් මූලස්ථානය වෙත එවිය යුතුය.

02 (111). එක් බන්ධනාගාර ආයතනයක් තුලම කර්මාන්ත බිල්පත් නිරවුල් කිරීම පිළිබඳව මනා පාලනයක් පවත්වාගෙන යා යුතුය.

බන්ධනාගාර කර්මාන්ත අංශය විසින් නිරවුල් කිරීම සඳහා එම බන්ධනාගාරයේම වැය අංශය වෙත ඉදිරිපත් කෙරෙන බිල්පත් සහිත වවුචර ඉදිරිපත් කල මාසය තුලදීම නිරවුල් වන්නේදැයි කර්මාන්ත ජේලර්වරයා විසින් සොයා බලන බවට බන්ධනාගාර අධිකාරීවරයා සෑහීමකට පත්විය යුතුය.

02 (1V). බන්ධනාගාර දෙපාර්තමේන්තුව තුල බන්ධනාගාර ආයතන විසින් අනිකුත් බන්ධනාගාර ආයතන වෙත බිල්පත් නිකුත් කල යුත්තේ, එම ආයතන වෙත භාණ්ඩ හා සේවා සැපයීමෙන් පසුව වියයුතු අතර, නොසපයන ලද භාණ්ඩ හා සේවාවන් වෙනුවෙන් බිල්පත් බන්ධනාගාර අධිකාරීවරුන් විසින් භාර නොගත යුතුය.

02 (V). රජයේ බිල්පත් ලියාපදිංචි කිරීමේදී මසකට එක් කට්ටලය බැගින් මුළු වසර සඳහා කට්ටල දොළහක් එක් බන්ධනාගාර ආයතනයකින් මූලස්ථානයට ලැබිය යුතුය.

03 (1). <u>රජයේ බිල්පත් (වෙනත් දෙපාර්තමේන්තු)</u>

රාජ්‍ය අංශයේ වෙනත් දෙපාර්තමේන්තු වෙත ණය පදනම මත භාණ්ඩ හා සේවා සැපයීමේ පිළිවෙත කිසිසේත් ක්‍රියාත්මක කලයුතු නොවේ.

03 (11). වෙනත් රජයේ දෙපාර්තමේන්තු වෙත නිකුත් කරන සෑම බිල්පතක් සඳහාම එම අවස්ථාවේදීම බන්ධනාගාර කොමසාරිස් (කර්මාන්ත) නමට ලියන ලද දින 60ක් වලංගු චෙක්පතකින් වටිනාකම අයකර ගැනීම කලයුතු අතර, බිල්පතෙහි මුල් පිටපත මුදල් ගෙවන ආයතනයට කෙලින්ම නිකුත් කල යුතුය. එක් පිටපතක් තමන් භාරයේ තබාගත යුතු අතර, වර්ගීකරණ ලේඛණය සමග තව පිටපතක් මූලස්ථානය වෙත එවිය යුතුය. සෑම චෙක් පතක් සමගම චෙක්පතට අදල බිල්පත් අංකය, දිනය, විස්තරය, නිකුත් කලේ කාටද යනවග හා අදල මුදල ද සඳහන් කර ආවරණ ලිපියක් මූලස්ථානයට එවීම ඉතා වැදගත්ය.

03 (111). ඔබගේ ප්‍රධාන ගනුදෙනුකාර දෙපාර්තමේන්තු සහ රජයේ වෙනත් ආයතන වලට මින්මතු ණය පදනම මත භාණ්ඩ හා සේවා නොසපයන බව කල්තබා දැනුම් දෙන්නේ නම් මැනවි.

ඒ ඒ මාසයේ සම්පූර්ණ කරන ලද ඇනවුම් වලට අදලව වියදම් නිමවූ වහාම සකස් කරන ලද බිල්පත් අප්‍රමාදව පරීක්ෂා කොට ඊලග මස 10 වැනි දිනට ප්‍රථම ලියාපදිංචිය සඳහා මූලස්ථානය වෙත එවීම ප්‍රමාද වීම නිසා ඒ ඒ මාසයට අදල විකුණුම් හරියාකාරව ගිණුම් ගත වීම සිදු නොවන බැවින් මාසයට අදල විකුණුම් ආදායම පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි තත්ත්වයකට පත්ව ඇත. මේ නිසා අප්‍රමාදව ඒ ඒ මාසයේ සකස් කරන බිල්පත් වහාම පරීක්ෂා කොට ඊලග මස 10 වැනි දිනට ප්‍රථම මූලස්ථානය වෙත ලියාපදිංචි සඳහා එවීම අනිවාර්ය වේ. ඉහත සඳහන් පරිදි කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදී, එය නිසි පරිදි සිදුවේදැයි අධීක්ෂණය කරන ලෙස දන්වමි.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

**සී.ඩබ්ලිව්. කොඩිප්පිලි**
**බන්ධනාගාර කොමසාරිස් ජනරාල්**
**බන්ධනාගාර මූලස්ථානය**
**කොළඹ 09.**